



# මුව හමට තඩිබාන ‘වසවිස’ නැති ‘ආහාර ප්‍රේමය’

EDITOR — OCTOBER 19, 2019 0 COMMENT

Tweet on Twitter Share on Facebook



ඇඟ ඇතුලට වසවිස පිවිසෙන්නේත් අප ඒ හරහා ලෙඩ වෙන්නේත් ගොවියා නිසාමද, පෙර සමාජයේ වසවිස පරිහරණයක් තිබුනේම නැතිද, විස නියාමනයට වත්මන් බලධාරීන් ගෙන ඇති පියවර මොනවාදැයි විමසා බැලීමත් එයින් දැනුවත් වීමත් කාලෝචිතයයි සිතෙන්නේ අවිද්‍යාව ඒ තරමටම රජ කරන පරිසරයක් අප අවට නිර්මාණය වී ඇති නිසාය.

වාතය, ජලය, ඇතුළු හැමතැනටම පාලනයක් නැතිව වසවිස

මිනිස් සිරුරට වසවිස ඇතුල්වෙන්නේ ආහාරයෙන් පමණක් නොවෙයි

දෛනිකව ශරීර ගතවෙන මාත්‍රාවයි වැදගත්

Search …

Lanka E Press
223 likes
Like Page Send
Be the first of your friends to like this

ARCHIVES
Select Month

FOLLOW US
Stay updated via social chanr




TAGS
ජනපති

**"බැරිද ඔය විද්‍යාඥයෝ ටිකට එකතුවෙලා අපිට එළවලු කඩේදී පාවිච්චි කරන්න පුළුවන් උපකරණයක් හදන්න. ඔය පලා මිටියකට වගේ දෙයකට ඒක ඇල්ලුවහම වසවිස ගහල තියෙනවද කියල අපිව දැනුවත් කරන්න පුළුවන් එකක් ගැනයි මං කතාකරන්නේ"**

එය දුරකතනයෙන් කල විමසීමකි. පසුගිය සැප්තැම්බරයේ 23 වෙනිදා උදෑසන එක්තරා එෆ්.එම්. නාලිකාවක් ඔස්සේ ප්‍රචාරය වූ සජීවී කෘෂිකර්ම වැඩසටහනකදී මා කල කරුණු දැක්වීමක් අසා සිටි අයෙක් වහාම දුරකතනයෙන් එම පැනය මා වෙත යොමුකරන ලදී.

කලබල තිබෙන කාලයට යම් ආයතනයකට ඇතුල්වෙත්දී ආරක්ෂක නිලදරුවන් විසින් අමුත්තන්ගේ හිස සිට පාදාන්තය දක්වා ස්පර්ශ කරවන, සාක්කු යනාදිය පසුකරද්දී 'බීප්' හඬ නංවන බැටන් පොල්ලක් වැනි උපකරණය ඔහුගේ සිහියට නැගුනා විය හැකියි.

එවැනි උපකරණයකින් පලා මිටියක් පිරික්සා 'බීප්' හඬ නැගෙත්ම අතැති පලාමිටිය එළවලු බක්කියටම අතහැර ආපසු යන පාරිභෝගිකයෙකුගේ සෙවනැල්ලක් එම ගුවන් විදුලි මැදිරිය තුලදීම මා ඉදිරියේ මැවී නොපෙනී ගියාසේද දැනුණි.

## පරිසරයට වසවිස මුදා හරින්ගේ ගොවියා විතරද ?



විද්‍යාත්මක දැනුම හා තාක්ෂනය සමග ගොවිතැන් කරන්නට යාමත්, අතීතයේ පැවති යැපුම් ගොවිතැන වර්තමාන වාණිජ කෘෂිකර්මාන්තයක් බවට පරිනාම ගතවීමත් මත වැඩිපුර කෘෂිරසායනික ද්‍රව්‍ය ගොවිබිම් වෙත පැමිණි බව නම් සැබෑය. ඒ දෙස මතුපිටින් බැලූ සමාජ ක්‍රියාකාරීන් කීප දෙනෙක්, තම දැනුමේ සීමාව තුල පැටලුම් හැරගත නොහැකි නිසා, මිනිසාට වැළඳෙන සෞඛ්‍යය ගැටළු සියල්ල ගොවිතැනේදී භාවිතා කරන කෘෂිරසායන ද්‍රව්‍ය මතටම පැටවීමට කටයුතු කල අතර ඇතැම් ජනමාධ්‍යයන්ද ඩෑෂ් ගසන්නට දැල අද්දරටම ඔවුනට බෝලය උස්සා දුන්හ. ඒ හමුවේ පරිසරයට වසවිස මුදාහරින අනෙකුත් සියලු අකටයුතුකම් සමාජ අවධානයෙන් බැහැර වුනි.

**පොකට් ගැසූ වරදට මිනීමැරුම් චෝදනාවක් පැටලුනු කලෙක මෙන් අසහනයට පත් ගොවියා හොර රහසේම වැරදි කරන්නට පෙළඹී තව තවත් මුරණ්ඩු චරිතයක් බවට පත්වුණි.**

ඉහල සංවේදීතාවයකින් හා සුපිරි ආරක්ෂාවකින් යුතුව නීතිරීති සුසර කරමින් වසවිස නියාමනයේ යෙදෙන රාජ්‍ය අංශය පවා අවිද්‍යාවේ මෙම ප්‍රහාර හේතුවෙන් සමාජය ඉදිරියේ බරපතල හැල්ලුවකට ලක්වුන අතර, ජනතාව ඔවුන් දෙස බැලුවේ තමාට පොවන්නට ගිනියම් ලෝදිය හැඳි අතදරා සිටින යමපල්ලන් දෙස බලනා විලාසයෙන්ය.

**ඇඟ ඇතුලට වසවිස පිවිසෙන්නේත් අප ඒ හරහා ලෙඩ වෙන්නේත් ගොවියා නිසාමද, පෙර සමාජයේ වසවිස පරිහරණයක් තිබුනේම නැතිද, විස නියාමනයට වත්මන් බලධාරීන් ගෙන ඇති පියවර මොනවාදැයි විමසා බැලීමත් එයින් දැනුවත් වීමත් කාලෝචිතයයි සිතෙන්නේ අවිද්‍යාව ඒ තරමටම රජ කරන පරිසරයක් අප අවට නිර්මාණය වී ඇති නිසාය.**

මීට අඩ සියවසකට පමණ පෙර ගමේ සිල්ලර කඩයක පවා මුදල් මේසය මත ලොසින්ජර බෝතල් කීපයක් වැරදුනේ නැත. එක බෝතලයක් ඇතුලේ නාරං බික් යනුවෙන් හැඳින්වුණු විවිධ පාටින් යුක්තවූ සීනිබෝල වර්ගයකි. තවත් බෝතලයක අනිවාර්යයෙන්ම සුදුපාට පෙපර්මින්ට් ය. මේ හැම එකකම මිල සතයකි. සත දහයක් දුන්විට කඩදාසි කැබැල්ලක දැවටූ පෙපර්මින්ට් පෙති දහයක් ලැබේ. නාගරිකයන් පෙපර්මින්ට් කියූවත්, ගම්මුන් මේවාට කීවේ 'පණුපෙති' කියාය.

## අසාධාරණ විවේචනයක් සමාජගත වෙලා

අද මෙන් දියුණු සෞඛ්‍යය පහසුකම් එදා ගමේ තිබුනේ නැත. ගමේ දරුවන් වනාහී සොබාදහමට යටත්ව හැදුනු වැඩුණු තවත් සත්ව කොට්ඨාශයක් නිසා ලපටි සන්ධියේදී 'පණුගාය' නොසැදුනු දරුවෙක් එකල ග්‍රාමීය සමාජයේ ඉතා විරල වූ අතර එය ඔවුන්ගේ සුලභ රෝගී තත්වයකි. බඩ රිදුම උහුලන්නට බැරිව පොඩි එකෙකු මරහඬ දී කෑගසද්දී ඇතැම් ගම්මු අත්බෙතක් ලෙස පණුපෙති කීපයක් ගෙනැවිත් දෙනවා මා දැක තිබේ. හැඬුම නතර වෙනවා වියහැකිය. ගුණයක් නැත්නම් එවැනි සිරිතක් සමාජ ගතවෙන්නේද නැත. සීනි පෙත්තකින් පනුවන් මැඩලූ අයුරු අදටත් මටනම් අභිරහසකි.

ඒ කෙසේ වෙතත් බටහිර වෛද්‍ය උපදෙස් ප්‍රකාරව 'ඇන්ටිපා' නමින් වූ සිරප් වර්ගයක් කුඩා දරුවන්ගේ පණු අමාරු වලට ප්‍රතිකාර වශයෙන් බොහෝ නිවෙස්වල එකල භාවිතා කෙරුණු අතර එම ඖෂධය බහා තිබූ අසුරණය පුරාවටම තිබුනේ එකට වෙලී සිටි වටපණුවන් පොකුරක පින්තූරයකි. ඇන්ටිපා දුන්විට ඇවිස්සෙන පනුවන් කුඩා දරුවන්ගේ නාසයෙන් පවා පිටතට එන බව ගම්මුන් කියනවා මා අසා තිබේ.

මියයන පනුවන් එක්කෝ මලපහ සමග පිටවෙන අතර නැතහොත් කුස තුලදීම ජීර්ණය වී යයි. පණුවන් මැරෙන්නේ බෙහෙත ඔවුනට විෂ නිසාය. එම මාත්‍රාව දරුවාට දැරිය හැකි නිසාත්, ක්ෂීරපායීන් වැනි උසස් ජීවීන්ගේ ශරීර ක්‍රියාවලියන්ට පණුබෙහෙතේ ඇති සංයෝග බාධා නොකරන නිසාත්, දරුවනට අවුලක් ඇති නොවේ. **කෙසේ වෙතත් මාත්‍රාව මත පිහිටා සිටීම අත්‍යවශ්‍ය බව කිව යුතුය.**

**ඇඟ ඇතුලේ වෙසෙනා පණුවන් මරන්නට උන්ට විසවෙන බෙහෙත් වර්ග ගිලදැමීමට වුවත් පසුබට නොවෙනා සමාජය, වම්බටු කරලක් විදිනා පණුවෙක් වෙනුවෙන් වස දියරයක් ඉසීම මෙතරම් බරපතල ලෙස විවේචනය කරන්නේ ඇයි දැයි ඔබ මෙතෙක් කල්පනා නොකලා වන්නට පුළුවන.**

මේ උත්සාහ කරන්නේ කෘෂිරසායන ද්‍රව්‍ය මත සුදුහුණු තවරන්නට නම් නොවේ. සමාජය පොදුවේ නිසිලෙස කරුණු අවබෝධ කරගෙන නොමැති නිසාත්, කිසිදු විද්‍යාත්මක පදනමක් නැතිව, එහෙත් හයියෙන් කතා පැවැත්විය හැකි කීපදෙනෙකුගේ අදහස් සංවේදී මිනිසා තුලට පහසුවෙන් ඇතුලුවෙන නිසාත්, මෙම වසවර්ග දෙක අද දවසේ කළු හා සුදු සෙවනැලි දෙකකි.

## මාත්‍රාව මත පිහිටා සිටීම අත්‍යවශ්‍ය බව කිව යුතුය

නමුත් අවධාරණය කල යුත්තේ පනුවන් මරන්නට මේස හැන්දක් පුරවා රසකර ගිලින 'බෙහෙත්' මෙන්ම, ගොවියා කරේ එල්ලාගෙන ඉසින 'තෙල්බෙහෙත්' ද නිර්දේශ මත පරිහරණය කල යුතු සංයෝග බවයි. ඖෂධ මගින් මිනිසාගේ සුවසෙත සැලසෙනා අතර කෘෂිරසායනයන් මගින් රැකෙන්නේ වගා බිමක පිහිටි බෝගයේ සෞඛ්‍යයයි. දෙකෙහිම අවභාවිතය භයානකය. ඒ නිසා මේ දෙක වෙනුවෙන්ම නියමිත මාත්‍රා ප්‍රකාශයට පත්කර තිබේ.

ගිලින බෙහෙත් හැරුණුවිට මිනිසා අතපත ගාන මේ සියලු පලිබෝධනාශකයන්ගේ නියාමනය භාරව සිටින්නේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකි. ඔහු පලිබෝධනාශක රෙජිස්ට්‍රාර්වරයාය. කුඹුරේ ලියැද්දට පමණක් නොව කැරපොත්තන් නසන්නට පැන්ට්‍රියේ කබඩ්එක අස්සට ඉසින රසායන ද්‍රව්‍යයන්ටද වගකියන්නේ ඔහුය. රෑ එළිවෙනතුරු ආඝ්‍රාණය කරමින් නිදියන මදුරුදහර දුමෙහි තිබිය යුතු වසවිස මාත්‍රාව පමණක් නොව, ලපැටියා නිතර හපන තොටිලි වැටේ තවරා ඇති තීන්ත තුල ඇත්තේ මොනවාදැයි අවධානයෙන් විමසන්නේද ඔහුය.

**ජනතාව නොදනිතත් මේ හැම තැනම ඇත්තේ විෂ රසායනික ද්‍රව්‍යයන් වේ. ඒ පිළිබඳව හැදෑරීම විෂ විද්‍යාව (Toxicology) සේ හැඳින්වේ.**

රෙජිස්ට්‍රාර්වරයාගේ තීරණයන් පහසු කරන්නට එම ක්ෂේත්‍රයේ හසලයින්ද ඔහු වටා සිටින අතර අප වහ කනහැටි දැනුවත් කරන්නට ඉදිරිපත්වූයේ එවන් නිලධාරිනියකි. ඇය විෂ විද්‍යාව පිලිබඳ ප්‍රධාන කෘෂි විද්‍යාඥ ජීවනී මාරසිංහ මහත්මියයි.

**"ගොවිතැනෙන් විතරක් නෙවෙයි, මහජන සෞඛ්‍යය ක්‍රියාකාරකම්, ගෘහාශ්‍රිත පලිබෝධ මර්ධනය, ආදී ප්‍රභවයන් රැසකින් විෂ රසායන පරිසරයට එකතු වෙනවා. ඒ නිසා ආහාර ද්‍රව්‍ය, වාතය, ජලය හා අවට පරිසරය විවිධ ප්‍රමාන වලින් මේ මගින් දූෂණය වෙලා තියෙන්න පුළුවන්. මේවා එක එක ප්‍රමාන වලින් ආහාර හෝ ජලය සමග, එහෙමත් නැත්නම් හුස්ම ගන්න වාතය සමග හෝ සම මත**

**තැවරිලා, යනාදී ඕනෑම ක්‍රමයකට අපේ ශරීර තුලට ඇතුළු වෙනවා. කුමන ආකාරයකට ඇතුල් උනත් විෂවීම තීරණය වන්නේ සිරුර තුලට එන මාත්‍රාව අනුව.”**



ජීවනී මාරසිංහ

### පරිසරයට වසවිස මුදා හරින්නෝ නොතැකීම

පරිසරයට හානිදායක වන අයුරින් වසවිස මුදාහරින මිනිස් ක්‍රියාකාරකම් බැලූ බැලූ අත ක්‍රියාත්මක වෙමින් තිබේ. පාරේ යන්නන් පමණක් නොව, පාර අද්දර ගෙවල් ඇතුලේ දනගාන කිරිසප්පයින්ගේත් පෙනහළු ලෙඩකරන තරමට කළු දුම් නංවමින් යන වාහනයකට දොසක් කියන්නට සමාජයේ කී දෙනෙක් ඉදිරිපත් වෙනවාද? මොහොතකට නහය වසාගෙන හිඳ, දුම පහවූ පසු තමාගේ පාඩුවේ වැඩක් බලාගැනීම සාධාරණද?




බස්රථයක පළමු ගියරය දමාගෙන හෙමිහිට ඉදිරියට ගනිමින් හා ආපසු පස්සට ගනිමින්, තමන් දැන් පිටත්වෙන බව හඟවමින් මගීන් රවටන රියදුරන් කෙතරම් විෂ වායු ප්‍රමාණයක් පරිසරයට මුදා හරිනවාද?

(පළමු ගියරය භාවිතා කල යුත්තේ වාහනයට වේගය අත්කර ගැනීමට ආරම්භයක් ගැනීම සඳහා මොහොතකට මිස, එක තැන පැද්දි පැද්දී සිටින්නට නොවේ. එම ගියරය වනාහී කාර්යක්ෂමතාවය අඩුම ගියරය වන අතර පරිසර දූෂණය වැඩිම ගියරයද වේ.) ඉන්ධන ප්‍රවාහනය සඳහා කාර්යක්ෂමව හැකිතාක් දුරට දුම්රිය යොදාගන්නේ නැතිව පාරවල් බඳුගන්නා තරමේ බවුසර් යොදාගැනීමෙන් කෙතරම් වායු දූෂණයක් වෙනවාද? එක පැත්තකින් බවුසරයෙන් පිටවෙන දුමය. තවත් අතකින් බවුසරය නිසා අවහිර වූ මාර්ගයේ හිරවූ වාහන වල දුමය. දුම්රිය මගින් මෙම ඉන්ධන ප්‍රවාහනය කෙරෙන්නේ නම් වායු දූෂණය පස් ගුණයකින් අඩු කල හැකි බව ජාත්‍යන්තරයේ පවා සනාථ වූ අදහසක් බව මෑතකදී මා සමග පැවසුවේ වෘත්තියෙන් යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකි.

### කෘෂි රසායනික නියාමනයට ජාත්‍යන්තර ප්‍රවේශය

වාණිජ කෘෂිකර්මයේ දියුණුවත් සමගම කෘෂිරසායනයන් ගේ භාවිතයද වැඩිවූ බැවින් මහජන සුරක්ෂිතතාවය උදෙසා කටයුතු නියාමනය කරන්නට ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයත්, ලෝක සෞඛ්‍යය සංවිධානයත් එක්ව ‘කෝඩෙක්ස් කොමිසම’ නමින් සංවිධානයක් පිහිටුවාගෙන තිබේ.

යම්කිසි රටක් විදේශයකින් ආහාර ගෙන්වා ගන්නා විටදී හෝ රට තුල වෙළඳාම් කිරීමට නිකුත් කරන අවස්ථාවේදී හෝ විෂ රසායනික ද්‍රව්‍යයක් එහි ඉතිරිව තිබිය හැකි උපරිම සීමාව පෙවාදෙමින් ප්‍රමිති නීති පනවන්නේ මේ කොමිසම මගිනි. එසේ වුවත් යම් රටකට මෙම සීමාවන් සියුම් වැඩියයි හැඟෙන්නේ නම්, තමාට ගැලපෙන පරිදි සීමා වෙනස්කොට ටිකක් වැඩිපුර වස කන්නට වුවද කිසිදු බාධාවක් නොමැත අතර අප රටෙහි නම් බොහෝවිට අනුගමනය කරන්නේ ඔවුන් පැනවූ සීමාවන්මය. ‘උපරිම අවශේෂ මට්ටම’ (Maximum Residue Level – MRL) වශයෙන් හඳුන්වන්නේ මෙයයි.

ඩයිසිනෝන් වගාවේ භාවිතා කෙරෙන කෘමි නාශකයකි. 2016 වසරේදී පළවූ පර්යේෂණ වාර්තාවකින් පෙන්වා දී තිබුනේ, ගොවිපොළවල් කීපයකින් එකතුකරගත් ගෝවා සාම්පල කීපයක සීමාව ඉක්මවා ගිය ඩයිසිනෝන් ප්‍රමාණයක් අන්තර්ගතව තිබූ බවයි. සාම්පල 90 කට වඩා එකතුකර තිබූ අතර මේ තත්වය තිබුනේ ඉන් කීපයක පමණක් නිසා ලිපිය කියවීමටත් පෙර ජපනුල් දමා ගැනීමට ඉක්මන් නොවන්න. කෝඩෙක්ස් MRL සීමාවට අනුව තිබිය හැක්කේ ගෝවා කිලෝග්‍රෑමයකට මෙම රසායනයෙන් මිලිග්‍රෑම් 0.05 ක් වුවත්, පරීක්ෂා කල ඇතැම් සාම්පල වල තුන් ගුණයක් පමණ වැඩියෙන් ඩයිසිනෝන් තිබුනේ අගය මිලිග්‍රෑම් 0.13 ක් තරම් ඉහලට වාර්තා කරමින්ය.

### තත්වය අවබෝධ කර ගැනීමේ වැදගත්කම

**“ඕනෑම කෙනෙකුට බැලූ බැල්මටම දැන් තේරුම් යනවා මෙවැනි ආහාරයක් අපට හානිකර වෙන බව. ඒ හරහා එකපාරටම හිතට එන අවදානමේ හැඟීම නිසා නොයෙක් දෙනා සරලව විවිධ දෑ ප්‍රකාශ කරනවා. මම**

**මේ ඩයිසිනෝන් යෙදූ ගොවියා නිදොස් කරනවාවත්, තොරතුරු සොයාගත් පර්යේෂකයාව හැල්ලුවට ලක් කරනවාවත් නෙවෙයි. ඒත් මේ අගය විද්‍යාත්මකව තව ටිකක් විවරණය කර බැලිය යුතුයි.”**



පලිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලයේ විෂ විද්‍යාඥ ජීවනී මහත්මිය විසින් වැඩි දෙනෙක් නොසිතනා මානයක් අපට පෙන්වන්නීය.



**“මේ අගය අපට හානිදායක වීමට වටාපිටාවේ තිබෙන කරුණු බොහොමයක් බලපානවා. පලිබෝධකාශකය යෙදූ අවස්ථාවේ සිටම එය වියෝජනය වෙමින් ඉවත් වෙනවා. ඒ කියන්නේ සැර බාල වෙනවා. අනෙක තමයි අපි ගෙදර ගෙනත් මෙය සෝදනකොට සැහෙන ප්‍රමාණයක් ඉවත් වෙනවා. දින ගණනක් ගෙදර එළවලු රාක්කයේ තියෙනකොට තව ටිකක් ඉවත් වෙනවා. හැබැයි මතක තියාගන්න, ශීතකරණයේ එළවලු දාල තියනකොට නම් ඉවත්වීම හෙමිනුයි සිදුවෙන්නේ. මොකද වසවිස වල වියෝජනය හොඳට සිදුවෙන්නේ කාමර උෂ්ණත්වයේදී. පිසීමේ ක්‍රියාවලියේදීත් ඉවත්වීමක් හෝ විෂ ද්‍රව්‍යයේ අක්‍රිය වීමක් හෝ වෙන්න පුළුවන්.”**



ඇයගේ පැහැදිලි කිරීමට අනුව වෙළඳපොලෙන් ගත් සාම්පලයක, පරීක්ෂනාත්මකව සොයාබැලීමේදී සිතට කනස්සල්ලක් දනවන විෂ අවශේෂ ප්‍රමාණයක උත්තරයක් ලැබුනත් එය ඒ ලෙසම ශරීර ගතවෙනවායි සැලකිය යුතු නැත.

## දෛනිකව පිළිගත හැකි ශරීර ගතවීම

මීට අමතරව ‘දෛනිකව පිළිගත හැකි ශරීර ගතවීම’ (Acceptable Daily Intake – ADI) නමින් රැකවරණයක් මනුෂ්‍ය ශරීරයට සොබාදහමෙන්ම උරුම කරදී තිබේ. සරලව කියනවානම් මින් අදහස් කෙරෙන්නේ සෞඛ්‍යය තර්ජනයක් නොමැතිව දිනකට සිරුර තුලට දමාගත හැකි වසවිස ප්‍රමාණයයි. දිගු කලක් තිස්සේ එම ප්‍රමාණයට වඩා අඩු මාත්‍රාවක් දිනපතා ශරීර ගතවූවත් හානියක් නොවන පරිදි බැහැර කිරීමට ශරීරය සූදානම්ය. මිනිසා දරන මෙම ස්වභාවික සවිය ADI යටතේ ඉලක්කමකින් ප්‍රකාශ කරන්නට කටයුතු යොදා ඇත්තේද කෝඩෙක්ස් සීමාවන් ජනගත කල සංවිධාන විසින්මය. නැවතත් විෂ විද්‍යාඥවරිය හඬ අවදිකරයි.



**“අපි හිතමු ඉහත සඳහන් කල දූෂිතම සාම්පලය කවුරුහරි සෝදන්නෙත් නැතුව අමුවෙන්ම කෑව කියල. කිලෝවක් කන්න බෑනේ, අපි හිතමු ග්‍රෑම් 100 ක් කෑවා කියල. එතකොට ශරීර ගතවෙන්නේ මිලිග්‍රෑම් 0.013 නේ. ඩයිසිනෝන් වල දෛනිකව පිළිගතහැකි ශරීර ගතවීමේ අගය දේහ බර කිලෝවකට මිලිග්‍රෑම් 0.0002 ක් වශයෙන් පෙන්වා දී තිබෙනවා. එහෙනම් බර කිලෝග්‍රෑම් 70 ක පුද්ගලයෙකුට මිලිග්‍රෑම් 0.0002 X 70 නොහොත් 0.014 ක දරාගැනීමේ හැකියාවකුත් කිලෝග්‍රෑම් 30 ක් බර දරුවෙකුට 0.0002 X 30 නොහොත් 0.006 ක දරාගැනීමේ හැකියාවකුත් දෛනිකව තිබෙනවා. ඒ කියන්නේ ඉහත ආහාරය වැඩිහිටියා දරාගත්තත්, දරුවාට එය විෂ සහිතයි. ඔය නිර්නායකයන් හදල තියෙන්නේ නිරෝගී මිනිසුන් පදනම් කරගෙන. රෝගීන්, ගර්භනී කාන්තාවන් වැනි අයට ඔය තරමට ඉහල දරාගැනීමේ හැකියාවක් නොතිබෙන්න පුළුවන්.”**

## දැන් ඉතින් අපි කොහොමද බේරිලා ඉන්නේ?

දැන් ඉතින් අපි කොහොමද බේරිලා ඉන්නේ? මා සමග කතාකල කීපදෙනෙකු ප්‍රශ්න කෙරුවේ එසේය.

**පරිසරයට වසවිස මුදාහරින මූලාශ්‍රයන් අතරින් ගොවියා යනු ඔයතරමට කලුපාට යක්ෂයෙක් නොවේ. ගොවියා මෙහෙයවන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවත් විද්‍යාත්මක හා සාධාරණ මෙහෙයුමක් කරමින් අත්‍යවශ්‍ය අවස්ථාවකදී පමණක් වස බෝතලය ගොවියාට දෙන්නට පරිසරය සාදා තිබේ.**

බඩට බෙහෙත් බොන තරමේ සැලකිල්ලකින් එය නිසිපරිදි භාවිතා කිරීම නම් ගොවියාගේ වගකීමකි. අතේ බෝතලය තිබුනාට ආවට ගියාට ඇඟේ හලා ගන්නේත්, ගොවිපොළට ඉසින්නේත් නැතිව අවම මට්ටමෙන් පරිහරණය කිරීමද ගොවියාටම භාර කටයුත්තකි. ලෙඩරෝග හා පලිබෝධකයින් ගොවිපොළට කැන්දා නොගන්නට වගබලා ගැනීමද ඔහු සතු වගකීමකි. ජලසම්පාදනය, පොහොර යෙදීම, සනීපාරක්ෂාව, ප්‍රතිරෝධී බෝග මාදිලි භාවිතය ආදී මෙකීනොකී සියල්ල මේ හා බැඳී පවතී.

## උග්‍ර විස සහිත පලිබෝධනාශක සියල්ල තහනම්



අපේ මුතුන් මිත්තන් ගොවිතැන් කෙරුවේ මේ සියලු කරුණු කාරනා එක මිටට ගෙන මිස, වෙන වෙනම සලකමින් නොවේ. ලාබෙට ලැබෙනවා කියා වැඩිපුර යූරියා ගැසුවහොත්, අස්වැන්න කෙසේ වෙතත් පැලැටි හොඳට කොලපාට වී, මාංසල වී වැඩෙන අතර, නිදිකිරා වැටෙන පලිබෝධකයින්ට වුවත් ඒවා කන්නට සිතීම අරුමයක් නොවේ. එසේනම් අත දිගහැර පොහොර දමන්නට උපදෙස් දෙන්නන්, ඒ සමග වස බෝතලයත් ගොවියාට දිය යුතුය.

රෝග වලට ප්‍රතිරෝධී මාදිලි දේශීයව නිපදවා තිබියදී, බෙහෙත් නැතිව අඩියක්වත් යා නොහැකි, පිටරටවල සෑදූ හයිබ්‍රිඩ් එළවලු පසුපස හඹායාමද වසවිස සහිත එළවලු වෙළඳපොළට ඒමට තවත් හේතුවකි.

**අනෙක් අතට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මේ වනවිට උග්‍ර විස සහිත පලිබෝධනාශක සියල්ල තහනම් කර භාවිතයෙන් ඉවත්කර තිබේ. ඉඩදී ඇත්තේ අවම විෂක් සහිත ඒවාටයි. ඒවාහි පසු අස්වනු කාලසීමාවද ඉතා අඩුය. එනම් බෝගයකට ඉසීමෙන් පසු ඉතා ඉක්මනට වියෝජනය වේ.**

මේ නිසා පැල සිටවූ දා පටන්ම බෙහෙත් ටැංකිය කරේ එල්ලාගෙන ඉන්නේ නැතිව බෝගය මෝරන තෙක් හෝ බලා සිට අවශ්‍යනම් පමණක් තෙල් බෙහෙත් ඉසීමේ හැකියාව ගොවියාට ලැබී ඇත්තේ මේ ආකාරයට කෙටි පසු අස්වනු කාලයක් සහිත වස දියර දෙපාර්තමේන්තුව මගින් භාවිතයට ඉඩදීම නිසාය.

නාහෙට නොහාන ගොවියෙකුගේ අවභාවිතාවක් නිසා වැඩි මාත්‍රාවක් කලාතුරකින් වෙළඳපොළට ආවත් ඉහත දැක්වූ ADI අගයට මුවාවී හෝ යම් ආරක්ෂාවක් සලසා ගැනීමට ගොවිතැන් නොකරන අපටත් හැකිවේවි. තමාගේ ආරක්ෂාව තමා විසින්ම සලසා ගතයුතු බව කියන්නට තිබුනේ එදා නොව අදය. හෙට දිනයේදී එය තවත් හයියෙන් කියන්නට සිදුවෙනවා විය හැකිය.


**සනත් එම්. බණ්ඩාර**

**Assistant Director of Agriculture National Agriculture Information and Communication Centre Gannoruwa, Peradeniya**



POST VIEWS: 1

Tweet on Twitter Share on Facebook



PREVIOUS ARTICLE
රටේ අනාගතය තීරණය කරන්නේ එක පවුලක්ද? – ඇමති වම්පික

NEXT ARTICLE


## Recommended For You